## WEATHER FORECAST FOR 28 OCTOBER 2019
(Issued at 12.00 noon on 27 October 2019)

**Due to the atmospheric disturbance developing to the Southeast of Sri Lanka, showery condition is likely to enhance over the island (particularly in the Northern, Eastern, North-Central and Uva provinces) from today. Cloudy skies can be expected over most parts of the island.**

Showers or thundershowers will occur over most provinces of the island.

Heavy falls of about 150 mm can be expected at some places in Northern, North-Central, Uva and Eastern provinces and in Hambanthota district. Fairly heavy falls of about 100 mm can be expected at some places in the Central and Sabaragamuwa provinces and Galle and Matara districts.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් අද සිට දිවයිනේ (විශේෂයෙන් උතුරු, නැගෙනහිර, උතුරු-මැද සහ ඌව පළාත්වල) වැසි තත්ත්වය වර්ධනය වන ලකුණු ඇත. දිවයිනේ බොහෝ ප්‍රදේශවල අහස වළාකුලින් බරව පවතිනු ඇත.

දිවයිනේ බොහෝ පළාත් වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

උතුරු, උතුරු-මැද, ඌව සහ නැගෙනහිර පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයෙත් ඇතැම් ස්ථාන වලට මි.මී. 150 පමණ වන තද වර්ෂාපතනයන් ඇති විය හැකි අතර මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 100 පමණ වන තරමක් තද වර්ෂාපතනයන් ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 27 October 2019)

**Due to the low level atmospheric disturbance in the south-eastern sea area, the possibility for heavy showers or thundershowers and sudden roughness, associated with sudden increase of wind speed (up to 70-80 kmph) in the sea areas off the coast extending from Matara to Kankasanturai via Batticaloa and Trincomalee is high. Naval and fishing communities are requested to be vigilant in this regard.**

Showers or thundershowers will occur in the sea areas around the island. Heavy showers can be expected in the deep and shallow sea areas to the Southeast, East and South of the island.

Winds will be North-easterly and speed will be (30-40) kmph in the sea areas around the island.

The sea area around the island can be fairly rough at times as the wind speed can increase up to (50-55) kmph at times.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
2019 ඔක්තෝබර් මස 27 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

දිවයිනට ගිණිකොන දෙසින් වන මුහුදු ප්‍රදේශයේ පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන්, මාතර සිට මඩකළපුව සහ ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තද වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 70-80 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී. ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයිනට ගිනිකොණ, නැගෙනහිර සහ දකුණු දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල තද වර්ෂාපතනයන් ඇති විය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමන අතර සුළඟේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා ඉහළ යාමට හැකියාවක් පවතින අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019/10/27
Time: 12.40 hrs
DISASTER MANAGEMENT CENTRE